# පාස්කු පූර්ව පූජ්‍ය තෙදින
# මහා බ්‍රහස්පතින්දා



# තෛලාශීර්වාදීක පූජා මෙහෙය

## පළමුවන කියැවීම යෙසායා 61: 1–3, 6, 8–9

*යෙසායා දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයකි.*

ස්වාමින් වහන්සේ මා ආලේප කළ සේක.
දිළිඳුන්ට සුභාරංචිය දේශනා කිරීම ද ඔවුන් ආනන්ද ජනක තෛලයෙන්
ආලේප කිරීමට ද මා එවූ සේක.

මහෝත්තම දෙවි සමිඳුන්ගේ ආත්මානුභාවය මා කෙරෙහි පිහිටා ඇත. දිළිඳුන්ට සුභ අස්න දෙසීමට ද බිඳුණු සිත් ඇත්තන්ට සුව සෙත දීමට ද වහලුන්ට මිදීම දානය කරන්න ද සිරකරුවන්ට නිදහස දන්වන්න ද එතුමාණන් මා ආලේප කළ සේක. සමිඳුන්ගේ කරුණාවේ දවස, සතුරන්ට දඬුවම් දීමේ දවස පළකරන පිණිස ද වැළපෙන සියල්ලන් සනසන පිණිස ද එතුමා මා ආලේප කළ සේක. සියොන්හි දුක් වන සැම දෙනාට අළු වෙනුවට මල් මාලා ද දුක් කඳුළු වෙනුවට ප්‍රීතිය නමැති තෛලය ද කළකිරී සිටින්නන්ට පැසසුම් නමැති වස්ත්‍රය ද ප්‍රදානය කරන පිණිස එතුමාණෝ මා ආලේප කළ සේක. ඔවුන්ගේ දැහැමිතාව සමිඳුන් රෝපණය කළ කිහිරි ගස් මෙන් ස්ථිර යයි කියනු ලැබේ. එයින් එතුමන්ට ම මහිමය හිමි වන්නේ ය. එහෙත් නුඹලා ‘සමිඳුන්ගේ පූජකයෝ ය’ යි කියනු ලබන්නහු ය.

මිනිසුන් නුඹලාට ‘අපේ දේව සේවකයෝ’ යි කියනු ඇත. නුඹලා ජාතීන්ගේ සම්පත් භුක්ති විඳ, ඔවුන්ගේ වස්තු හිමි කරගනු ඇත.

සමිඳාණෝ මෙසේ වදාරණ සේක. “මම යුක්තියට ප්‍රිය කරමි. අදම්වූකමටත්, කොල්ලකෑමටත් ද්වේශ කරමි. එබැවින් මම අවංක ලෙස ඔවුන්ට විපාක දෙමි. සදාකාල ගිවිසුමක් ද ඔවුන් සමඟ කරගන්නෙමි. ඔවුන්ගේ වංශය ජාතීන් අතරේ ද ඔවුන්ගේ පරම්පරාව ජනයන් අතරේ ද ප්‍රසිද්ධ වන්නේ ය. ඔවුන් හැඳින ගන්න සියල්ලෝ ඔවුන් සමිඳුන්ගේ ආසිරි ලත් සෙනඟ බව දැනගන්නෝ ය.”

*දේව වාක්‍යය එසේය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 89: 20 – 21, 24, 26

පිළිතුර:සමිඳුනි, ඔබේ තිර පෙම ගැන සදහට ම ගයන්නෙමි.

ගීය: මා සේවක දාවිත් මම සොයා ගත්තෙමි.
ශුද්ධ තෛලයෙන් මම ඔහු ආලේප කළෙමි.
මාගේ ශක්තිය තිරතුරු ඔහු සමඟ වන්නේ ය.
මාගේ බලය ඔහු සවිමත් කරන්නේ ය.

මාගේ විශ්වාසවන්තකම සහ තිර පෙම ඔහු සමඟ වන්නේ ය.
මාගේ නාමයෙන් ඔහු ජයග්‍රාහී වන්නේ ය.

ඔහු මට මොර ගසමින් 'ඔබ මාගේ දෙවිඳාණෝ ය,
මාගේ පියාණෝ ය, මාගේ ආරක්ෂක පර්වතයාණෝ ය' කියන්නේ ය.

## දෙවන කියැවීම එළිදරව්ව 1: 5–8

*එළිදරව්ව පොතෙන් ගත් පාඨයකි.*

දෙවි පියාණන් හට සේවය කරනු වස් අප රාජකීය පූජක පරපුරක් බවට පත් කළ සේක.

මළවුන්ගෙන් උත්ථාන වූ කුළුඳුලාත්, මිහිපිට රජුන්ගේ අධිපතියාත් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගෙන් ද, ඔබට කරුණාව හා ශාන්තිය වේවා! උන්වහන්සේ අපට ප්‍රේම කරන සේක. සිය දිව් පිදීමෙන් අප පවින් මිදූ සේක. තම පියාණන් වන දෙවියන් වහන්සේට සේවය කරන පිණිස උන්වහන්සේ අප රාජකීය පූජක වංශයක් කළ සේක. ඒ තැනැන් වහන්සේට මහිමය ද බලපරාක්‍රමය ද සදහට ම වේවා! ආමෙන්. බලන්න, උන්වහන්සේ වලාකුළු පිරිවරා වඩින සේක. සියල්ලෝ උන්වහන්සේ දකින්නෝ ය. කුරුසියේ ඇණ ගැසූ අයද උන්වහන්සේ දකින්නෝ ය. මිහිපිට සියලු ජාතිහු උන්වහන්සේ නිසා වැළපෙන්නෝ ය. එය සැබෑම ය. ආමෙන්.

‘ආරම්භය ද අවසානය ද මම වෙමි’ යි වැඩසිටින, වැඩසිටිය, මතු වඩින සර්ව පරාක්‍රම ස්වාමින් වන දෙවියන් වහන්සේ වදාරණ සේක.

*දේව වාක්‍යය එසේය.*

## සාධුකාරය ලූක් 4: 18

ස්වාමින් වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත.
කුමක් නිසා ද දිළිඳුන් හට සුභාරංචිය දේශනා කරනු වස්
උන්වහන්සේ මා ආලේප කළ සේක.

## සුවිශේෂය ලූක් 4: 16–21

*සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේ ය.*

### ස්වාමින් වහන්සේ මා ආලේප කළ සේක.

උන්වහන්සේ තමන් ඇතිදැඩි වූ නාසරෙත් නුවරට පැමිණ සිරිත් පරිදි සබත් දවසේ දී ධර්ම ශාලාවට වැඩම කර කියවීම පිණිස නැගිට සිටි සේක. එවිට දිවැසිවර යෙසායාගේ ග්‍රන්ථය උන්වහන්සේට දෙන ලද්දේ ය. උන්වහන්සේ ග්‍රන්ථය දිගහැර මෙසේ ලියා ඇති තැන සොයා ගත් සේක.

“ස්වාමින් වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. කුමක් නිසාද දිළිඳුන් හට සුභාරංචිය දේශනා කරනු වස් උන්වහන්සේ මා අලේප කළ සේක. වහළුන්ට මිදීම ද, අන්ධයන්ට පෙනීම ද, ලැබෙන බව දන්වන්නටත් පීඩිතවූවන් මුදන්නටත්, ස්වාමින් වහන්සේගේ ප්‍රසාදය ලත් වසර ප්‍රකාශ කරන්නටත් මා එවා වදාළ සේක.” උන්වහන්සේ එය කියවා ග්‍රන්ථය අකුළා, උපස්ථායක තැනට දී වැඩහුන් සේක. එකල ධර්ම ශාලාවෙහි සිටි සියල්ලෝ උන්වහන්සේ කෙරෙහි නෙත් යොමා සිටියහ. උන්වහන්සේ ඔවුන්ට කතා කරන්ට පටන් ගෙන, “අද ඔබ සවන් දී සිටිය දී ම මේ ශුද්ධ ලියවිලි පාඨය ඉෂ්ඨ වීය” යි වදාළ සේක.

*සුවිශේෂ වාක්‍යය එසේ ය.*

# සමිඳුන්ගේ බොදුන් මඟුල සමරණ සන්ධ්‍යා පූජා මෙහෙය

## පළමුවන කියැවීම නික්මයාම 12: 1-8, 11-14

*නික්මයාම පොතෙන් ගත් පාඨයකි.*

"මේ දවස තුඹලාට අනුස්මරණ දිනයක් ද
මා හට මංගලෝත්සව දිනයක් ද විය යුතුයි."

සමිඳාණන් වහන්සේ මිසර දේශයේ දී මෝසෙස් හා ආරොන්ට කතා කොට මෙසේ වදාළ සේක. මෙම මාසය හැම මාසවලටම මුල් මාසය විය යුතුය. අවුරුද්දේ පළමුවන මාසයද විය යුතුය. තුඹලා මුළු ඊශ්‍රායෙල් ජනතාව අමතා, මෙසේ නිවේදනය කළ යුතුය. "මේ මාසයේ දසවන දින හැම මිනිසෙක්ම එක් ගෙදරකට බැටළු පැටවකු බැගින් පවුලකට බැටළු පැටවකු සපයා ගත යුතුය. යම් ගෙදරක වැසියන්ට එක් බැටළු පැටවෙකු වැඩිනම් ඔවුන් අසල්වැසි ගෙදර අයගේ සංඛ්‍යාව අනුව ඊට හවුල් කර ගත යුතුය. බැටළු පැටවා අනුභව කරන්නන්ගේ ගණන ගිණිය යුත්තේ එක් එක්කෙනා අනුභව කරන ප්‍රමාණය අනුවය. තුඹලා ගන්න බැටළු පැටවා කැළැල් රහිත අවුරුද්දක් වයසැති පිරිමි සතෙකු විය යුතුය. තවද බැටළුවන් හෝ එළුවන් හෝ අතරින් එවැනි එකෙකු තෝරා ගත හැකිය. එම මාසයේදීම දහ හතරවන දින දක්වා ඌ තබාගෙන, එදින සවස රැස්වන මුළු ඊශ්‍රායෙල් ජනතාව ඌ මැරිය යුතුය.

ඉන්පසු ඌගේ ලෙයින් ටිකක් රැගෙන බැටළු පැටවා අනුභව කරන අයගේ ගෙදර දොරේ උළුවහු කණු දෙකේ ද උළුවස්සේ උඩ ලීයේද තැවරිය යුතුය. එම රාත්‍රියේදී ඌගේ මාංශ අනුභව කළ යුතුය. එය අනුභව කළ යුත්තේ, මඳගින්නේ පුළුස්සා, නුමුහුන් රොටි හා තිත්ත පලා සමඟය.

තවද තුඹ එය අනුභව කළ යුත්තේ මෙසේය. ඉගටිය බැඳ, පාවහන් ලා, සැරයැටිය ගෙන, එය ළඟි ළඟියේ අනුභව කළ යුතුය. මන්ද, එය සමිඳාණන් වහන්සේ වන මා හට පවත්වන පාස්කුව බැවිනි. එදින රාත්‍රියේ මම මිසර දේශය මැදින් ගොස්,

එහි මිනිසුන්ගේ හා මෘගයන්ගේ කුළුඳුලන්ට පහර දෙමි. තවද මිසරයේ දෙවි දේවතාවුන් සියල්ලන්ට දඬුවම් පමුණුවමි. මම සමිඳාණන් වහන්සේය. තුඹලා සිටින ගෙවල් මත තවරා ඇති ලේ තුඹලා ඒවායේ සිටින බවට ලකුණක් වන්නේය. මම ලේ දකින විට තුඹලා පසුකර යන්නෙමි. මිසර දේශයට මා පහර දෙන විට ඒ මාරක දඬුවම තුඹලා වෙත නොපැමිණෙනු ඇත. මේ දවස තුඹලාට අනුස්මරණ දිනයක් ලෙසද සමිඳාණන් වහන්සේ වෙත මා හට මංගලෝත්සව දිනයක් ලෙස ද පැවැත්විය යුතුයි. තවද මතු සියලු පරම්පරාවලම එය සදහටම මංගල දිනයක් සේ පැවැත්වීමට නියෝගයක් පැනවිය යුතුය.

*දේව වාක්‍යය එසේය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 116: 12–13, 15–18

**පිළිතුර:** ආසිරි කුසලානෙන් අපි සමිඳාණන්ගේ රුධිරයට සහභාගි වන්නෙමු.

**ගීය :** සමිඳුන් මා හට කළ සියලු යහපත්කම ගැන
එතුමන්ට මම කුමක් පුදමි ද?,
මම ගැළවීමේ කුසලාන ගන්නෙමි.
සමිඳුන්ගේ නාමයෙන් යාච්ඤා කරන්නෙමි.

සැදැහැවතුන්ගේ මරණය සමිඳුන් අබියස අගනේ ය.
සමිඳුනි, මම ඔබේ මෙහෙකරුවෙක් වෙමි.
සැබැවින්ම ඔබේ මෙහෙකරුවෙක් වෙමි.
ඔබේ දාසියගේ පුත්‍රයා වෙමි. ඔබ මාගේ බැඳුම් මිදූ සේක.

මම ඔබට ස්තුති පූජාව පුදන්නෙමි.
සමිඳුන්ගේ නාමය අමතා අයදින්නෙමි.
එසේය, සමිඳුන්ගේ මුළු සෙනඟ ඉදිරියෙහි
මාගේ බාර හාර ඉටු කරන්නෙමි.

## දෙවන කියැවීම 1 කොරින්ති 11: 23-26

*ශුද්ධ වූ පාවුළු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.*

**මේ පූපය වළඳන, මේ කුසලානෙන් පානය කරන සැමවිටම**
**ඔබ ස්වාමීන් වහන්සේගේ මරණය ප්‍රකාශ කරන්නාහුය.**

මා ඔබට ඉගැන්වූ මේ පිළිවෙතම ස්වාමීන් වහන්සේගෙන්ම ලැබුවෙමි. එනම් ස්වාමීන් වන ජේසුස් වහන්සේ පාවා දෙනු ලැබූ රාත්‍රියේදී පූපයක් රැගෙන ස්තුති කොට කඩා "මෙය ඔබ උදෙසා දෙන මාගේ ශරීරය ය. මා සිහිකිරීම පිණිස මෙය කරන්නැ" යි වදාළ සේක. එලෙසම රාත්‍රී කෑමෙන් පසු කුසලානයද රැගෙන "මේ කුසලාන මාගේ රුධිරයෙන් පිහිටුවන නව ගිවිසුම ය. යම් පමණ වර ඔබ මෙයින් පානය කරන්නහුද, එපමණ වර මා සිහිකිරීම පිණිස මෙය කරන්නැ" යි වදාළ සේක. ඔබ යම් පමණ වර මේ පූප අනුභව කරන්නහුද, මේ කුසලානෙන් පානය කරන්නහුද එපමණ වර ස්වාමීන් වහන්සේ වඩින තුරු ඔබ උන්වහන්සේගේ මරණය ප්‍රකාශ කරන්නහුය.

*දේව වාක්‍යය එසේය.*

## සාධුකාරය ජුවාම් 13: 34

"මම ඔබට අළුත් ආඥාවක් දෙමි.
මා ඔබට ප්‍රේම කළාක් මෙන්
ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්නැ" යි
ස්වාමීන් වහන්සේ වදාරන සේක.

## සුවිශේෂය ජුවාම් 13: 1-15

*සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.*

**ජේසුස් වහන්සේ තමන් වහන්සේගේ ප්‍රේමයේ ගැඹුර දක්වන සේක.**

තමන් මෙලොවින් ඉකුත්ව පියාණන් වෙතට යාමේ නියමිත මොහොත පැමිණ තිබෙන බව පාස්කු මංගල්‍යයට පෙර, ජේසුස් වහන්සේ දැනගත් සේක. උන්වහන්සේ මෙලොව තම හිතවතුන්ට ප්‍රේම කළ සේක. අන්තිම දක්වාම ඔවුන්ට ප්‍රේම කළ සේක.

රාත්‍රී භෝජනය වළඳන වේලාව පැමිණියේය. යක්ෂයා උන්වහන්සේ පාවා දීමට සීමොන්ගේ පුත් ජුදස් ඉස්කාරියොත්ගේ සිත ඒ වන විටත් පොළඹවා තිබිණි. පියාණන් වහන්සේ තමන් අතට සියල්ල පවරා දී තිබෙන බව ද තමන් දෙවියන් වහන්සේ වෙතින් වැඩම කළ බව ද තමන් දෙවියන් වහන්සේ වෙතට වැඩම කරන බව ද දැන, රාත්‍රී භෝජනයෙන් පසු උන්වහන්සේ නැගිට උතුරු සළුව ගලවා තබා, තුවායක් ගෙන ඉණ වටා බැඳගත් සේක. ඉන්පසු උන්වහන්සේ භාජනයකට වතුර වත්කොට, ශ්‍රාවකයන්ගේ පාද සෝදන්නටත්, තමන් ඉණ බැඳගෙන සිටි තුවායෙන් පිස දමන්නටත් පටන් ගත් සේක. උන්වහන්සේ සීමොන් පේදුරු ළඟට ආ විට "ස්වාමිනි, ඔබවහන්සේ මාගේ පාදත් සෝදන සේක්දැ" යි ඔහු ඇසීය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "මා කරන්නේ කුමක් දැ යි ඔබ දැන් නොදන්නෙහි ය. එහෙත් පසුව ඔබට වැටහෙනු ඇතැ" යි වදාළ සේක. එවිට පේදුරු "මා දිවි ඇති තෙක් කවදාවත් මාගේ පාද සෝදන්නට නම් ඔබ වහන්සේට ඉඩ නොදෙමි." යි කීය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින් "මා ඔබ නොසේදුවොත් මා සමඟ සම්බන්ධකමක් ඔබට නැතැ" යි වදාළ සේක. එවිට සීමොන් පේදුරු, "ස්වාමිනි, මාගේ පාද පමණක් නොව අත්ද, හිසද සේදුව මැනව" යි කීය. ජේසුස් වහන්සේද "ස්නානය කළ තැනැත්තේ මුළුමනින්ම පවිත්‍රය. පාද සේදීම හැර ඔහු නවත් සෝදනු ලබන්නට වුවමනා නැත. ඔබ ද පවිත්‍රය. එහෙත් හැමකෙනෙක්ම එසේ නොවෙති" යි වදාළ සේක. "හැම කෙනෙක්ම පවිත්‍ර නොවෙති" යි උන්වහන්සේ වදාළේ තමන් පාවා දෙන්නා කවරෙක්දැයි දැන සිටි බැවිනි. මෙසේ උන්වහන්සේ ඔවුන්ගේ පාද සෝදා, තමන් උතුරු සළුව හැඳගෙන

නැවත හිඳගත් කළ, ඔවුන්ට මෙසේ වදාළ සේක. "මා ඔබට කළ දේ කිමෙක්දැයි ඔබ දන්නහුද? ගුරු දේවයිනි, ස්වාමීනි කියා ඔබ මා අමතන්නහුය. එසේ කීම හරිය. මම එසේම වෙමි. ඔබේ ස්වාමීන් ද ගුරු දේවයන් ද වන මා ඔබේ පාද සේදුවෙමි නම්, ඔබත් එකිනෙකාගේ පාද සේදිය යුතුය. මා ඔබට කළාක් මෙන් ඔබත් කළ යුතු බවට ආදර්ශයක් මම දුනිමි."

*සුවිශේෂ වාක්‍යය එසේය.*